# රටේ සංවර්ධනය උදෙසා කෘෂිකර්මාන්තයේ කාර්යභාරය

**ලෝ**ක සංවර්ධනයේ දී වැඩි අවධානයක් යොමු වන්නේ කාර්මික හා සේවා අංශයන් කෙරෙහි වුවත් කෘෂි අංශය කිසි විටෙකත් අමතක කළ නො හැකිය. ඒ දිනෙන් දින ඉහළ යන ලෝක ජනගහනය හේතුවෙනි. මේ නිසාම, අන් කවරදකටත් වඩා කෘෂි අංශය කෙරෙහි ලෝක අවධානය යොමු ව පවතී. ලෝක ආහාර සංවිධානයේ සාමාන්‍යාධිකාරී (Jacaues Diouf) වසර 2050 දී ලෝක ජනගහනයට ආහාර සපයන්නේ කෙසේ ද (How to feed the world in 2050) යන මැයෙන් පැවති සමුළුවක් අමතමින් සඳහන් කළේ ඉදිරියේ දී ජනගහන වර්ධනයත් සමඟ ආහාර සපයා ගැනීම පිළිබඳ අභියෝග රැසක් පවතින බවයි. ඒ අතරින් ඉදිරි වසර 40 තුළ දනට බිලියන 6.7ක් වන ලෝක ජනගහනය බිලියන 9.1 දක්වා ඉහළ යන බවත් ඉහළ යන ජනගහනය වෙනුවෙන් ආහාර නිෂ්පාදනය 70%කින් ඉහළ නැංවිය යුතු බවත්, ඔහු පෙන්වා දෙයි. එසේ වුව ද, ඒ සඳහා අභියෝග රැසක් පවතින බව ඔහු වැඩිදුරටත් සඳහන් කරයි. එනම්, දේශගුණික විපර්යාස, ගංවතුර, නියඟය, ඉඩම් හිඟකම, ගෝලීය උෂ්ණත්වය ඉහළයාම වැනි සාධකයන් ය. මේ සියළු අභියෝග හමුවේ කෘෂිකාර්මික අංශය වඩා විධිමත්ව සංවර්ධනය කිරීමේ භාරදූර වගකීමෙන් මිදීමට කිසිදු රටකට හැකියාවක් නො පවතී.

ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල් පිළිබඳව ඉතා සූක්ෂම ව කරුණු සොයා බැලීමේ දී එම රටවල ජාතික ආර්ථිකයට කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් සුවිශේෂී දායකත්වයක් ලබා දෙන බව පෙනේ. විශේෂයෙන් ම ඇමරිකාව, ප්‍රංශය, බ්‍රිතාන්‍ය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, රුසියාව වැනි සංවර්ධිත රටවල ආර්ථික සංවර්ධනයේ මූලික අවස්ථාවේ දී කෘෂිකර්මාන්තයෙන් ලද අනුග්‍රහය විශාල වශයෙන් වර්ධනය කර ගනිමින් වර්තමානයේ කෘෂි අංශයේ විශාල ප්‍රගතියක් අත් කර ගෙන තිබේ. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස, ශ්‍රී ලංකාව තුළ කෘෂි අංශයේ දායකත්වය තව තවත් වර්ධනය කර ගැනීමේ ශක්‍යතාවයන් හඳුනා ගත හැකි වේ.

කෘෂිකර්මාන්තය සඳහා හිතකර භූමියක් ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම පැවතීම සුවිශේෂී තත්ත්වයකි. සමකයට ආසන්න සර්ම කලාපීය රටක් වන ශ්‍රී ලංකාව තුළ තෙත් කලාපීය, අන්තර් මධ්‍ය කලාපීය සහ වියළි කලාපීය වශයෙන් රට පුරා ම විවිධාකාරයේ කෘෂිකාර්මික බෝග වගා කිරීමේ හැකියාව පවතී. ඒ අනුව, එළවළු සහ පළතුරු, වී ඇතුළු ධාන්‍ය වර්ග මෙන් ම කිරි නිෂ්පාදනය, සත්ත්ව පාලනය ඉලක්ක ගත තත්ත්වයකට වර්ධනය කර ගැනීමට අවශ්‍ය සම්පත් සහ සාධක ද මෙහි දක්නට ලැබේ. මෙලෙස විසිරී පවතින සම්පත් කළමනාකරණය තුළ කෙටි කාලීනව දේශීය ආහාර නිෂ්පාදනය ඉතා ඉහළ අගයක් කරා මෙහෙයවීමේ හැකියාව පවතී.

වර්තමානය වන විට, ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය තුළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය ක්‍රමයෙන් අඩුවීමක් දක්නට ලැබේ. ඒ අනුව, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය 1972-21%ක් ව පැවතියත්, එය 2002 දී 14%ක් ද, 2009 දී 12%ක් ද වැනි තත්ත්වයක පැවතීම සතුටුදායක නොවේ. රටක් දියුණු වන විට කෘෂිකාර්මික අංශයේ සාපේක්ෂ වැදගත්කම අඩුවීම අනිවාර්ය ලක්ෂණයක් වුවත්, එමඟින් එහි ඇති වැදගත්කම අඩුවීමක් පිළිබඳ අදහසක් කිසිසේත් ගම්‍ය නොවේ.

ශ්‍රී ලංකාව එක් අවධියක දී විදේශ රටවලට සහල් පවා අපනයනය කරන ලද කෘෂි කර්මාන්තය මත පදනම් වූ ශක්තිමත් ආර්ථික පසුබිමක් පවතින රටක් ලෙස නම් දරා තිබුණි. එසේ වුව ද, එද කෘෂි ආර්ථිකය වර්තමානයේ ඇඟළුම් ආර්ථිකයක් බවට පත්ව තිබේ. එද අතිරික්තය වෙනුවට වර්තමානයේ අඟහිඟකම ඉතිරි ව ඇත. වර්තමානයේ බොහෝ දේ ආනයනය කරයි. එද ඉඩම් අක්කරය වර්තමානයේ පර්චසය බවට පරිවර්තනය වී තිබේ. 30 වසරක යුද්ධයේ නිමාවත් සමඟම, ශ්‍රී ලංකාව සංවර්ධනයේ නව මාවතකට පිවිසෙමින් සිටී. ඉදිරි වසර 5-10 තුළ ශ්‍රී ලංකාව ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර ඒ සඳහා

ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් රාශියක්ම ක්‍රියාවට නැංවෙමින් පවතී. එහි දී, කෘෂි අංශයට ඉතා සුවිශේෂී ස්ථානයක් හිමි වනු නො අනුමානය.

**කෘෂිකාර්මික අංශයේ ආරම්භය**

ලෝක ඉතිහාසයේ කෘෂි අංශයේ පරිණාමය පිළිබඳ ව සලකා බැලීමේ දී එය වසර දස දහසකට පමණ පෙර යුගයෙන් ආරම්භ වී තිබේ. එකී ආරම්භය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී, එය ප්‍රධාන යුග කිහිපයකට බෙද දක්විය හැකිය. එනම්,

- නියෝලිතික කෘෂිකාර්මික විප්ලවය (Neolathic Agriculture Revolution)
- මුස්ලිම් කෘෂිකාර්මික විප්ලවය (Muslim Agriculture Revolution)
- බ්‍රිතාන්‍ය කෘෂිකාර්මික විප්ලවය (Agriculture Revolution in Britain)
- යටත්විජිත කෘෂිකර්මාන්ත හා ව්‍යාපාරික වතු වගාව පිළිබඳ දේශගුණික න්‍යාය (Colonial Agriculture and Climatic Theory of Plantation)
- හරිත විප්ලවය (Green Revolution)
- ආහාර ජානමය වශයෙන් වෙනස් කිරීමේ විප්ලවය (Revolution in Genatically Modified Foods)

නියෝලිතික කෘෂිකාර්මික යුගයේ දී මූලික වශයෙන් ම දක්නට ලැබුණේ යැපුම් කෘෂි කර්මාන්තයකි. තමන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය වගා කර ගැනීම මෙහි මූලික ම ලක්ෂණයයි. දඩයම් යුගයෙන් මිදුණු මිනිසා, ආහාර බෝග වගාවට නැඹුරු වූ මෙම යුගය, ලෝක කෘෂිකාර්මික පරිණාමයේ සන්ධිස්ථානයක් ලෙස හඳුනා ගත හැකිය. 13 වන සියවසේ දී මුස්ලිම් කෘෂිකාර්මික විප්ලවය තුළින් සිදු වූයේ යැපුම් කෘෂිකර්මය වෙනුවට වෙළෙඳපොළ සඳහා ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමයි. මෙහි දී කපු, අඹ, සහල්, උක් වැනි නව බෝගයන් ලොව පුරා ව්‍යාප්ත වීම ද ආරම්භ විය. 1500-1850 යුගයේ බ්‍රිතාන්‍යයේ සිදු වූ කෘෂිකාර්මික විප්ලවය තුළින් කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය තවදුරටත් සිදු විය. කෘෂි අංශයේ නියැළෙන්නන්ගේ ප්‍රතිශතය ද මේ යුගයේ දී ක්‍රමයෙන් ඉහළ ගියේ ය. නිෂ්පාදනය ඉතා සීග්‍ර ලෙස වර්ධනය විය. යටත් විජිත කෘෂිකර්මාන්තය හා ව්‍යාපාරික වතු වගාව ලෝක කෘෂි පරිණාමයේ ඉතිහාසය විමර්ශනය කරන්නෙකුට සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස වටහා ගත හැකි වේ. ඊට හේතුව වන්නේ මෙහි දී යුරෝපීයයන් පෙරදිගට පැමිණ ඇතැම් රටවල් තම පාලනයට නතු කර ගැනීමත් සමඟ ම නව කෘෂි සංස්කෘතියක් හඳුන්වා දුන් නිසා ය. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව වැනි දකුණු ආසියානු කලාපීය රටවල් තුළ මේ තත්ත්වය කැපී පෙනේ.

1940-1960 කාලයේ දී සිදු වූ හරිත විප්ලවය කෘෂි ඉතිහාසයේ දැවැන්ත පෙරළියක් කළ යුගයකි. මේ යුගයේ දී ඉහළ අස්වැන්නක් සහිත බෝග වර්ග හඳුන්වාදීම සිදු විය. තාක්ෂණය යොද ගනිමින් යම් යම් කෘෂි බෝගයන් වැඩි දියුණු කර ලබා ගත හැකි අස්වැන්නේ ප්‍රමාණය ඉහළ නැංවූ අතර එය ගොවීන්ට මහත් වාසිදායක තත්ත්වයක් විය. හරිත විප්ලවයේ පුරෝගාමියා වන්නේ ඇමරිකානු ජාතික නෝමන් බෝලාග් ය. හරිත විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස අස්වැන්න වැඩිවීමත් සමඟ ම ආදයම ද ඉහළ ගිය අතර පොහොර, කෘමිනාශක වැනි රසායනික ද්‍රව්‍ය යන්ගේ භාවිතය ද, අස්වැන්න ඉහළ යාමට හේතු විය. හරිත විප්ලවය සමඟ කෘෂි වගා රටාවන්ගේ ද කැපී පෙනෙන වෙනසක් සිදු විය. එහි දී, වසරකට එක් වතාවක් පමණක් අස්වැන්න ලබා ගත හැකි බෝග, වසරකට දෙවතාවක් අස්වැන්න ලබා ගත හැකි ආකාරයට වැඩි දියුණු කරනු ලැබී ය. ලෝක ජනගහන වර්ධනයත් සමඟ ලැබූ මෙම දියුණුව කෘෂි ක්ෂේත්‍රය නව මාවතකට යොමු කිරීමට හේතු විය. කෘෂිකාර්මික පරිණාමය පිළිබඳ ව කතා කිරීමේ දී, මෑතක දී සිදු වූ දැවැන්තම විප්ලවය වූයේ, ජානමය වෙනස්කම් සහිත ආහාර විප්ලවය යි. ජානමය වශයෙන් සංවර්ධනය කළ ප්‍රථම බෝගය වන්නේ තක්කාලි බෝගයයි. එය හඳුන්වා දෙනු ලැබුවේ 1990 දී කැලිෆෝර්නියානු සමාගමක් මඟිනි. එහි උච්ඡතම අවස්ථාව ලෙස ලොව ආන්දෝලනයට පත් වූ සිද්ධියක් වූයේ 1996-2003 කාලයේ ක්ලෝනකරණයෙන් බිහි කළ ඩොලී නම් බැටළුවායි. වර්තමානය වන විට ක්ලෝනිකරණය පිහාටු නොමැති කුකුළෙක් බිහි කිරීම දක්වා

වර්ධනය වී තිබේ. ඒ කෘෂිකාර්මික අංශයේ තාක්ෂණික දියුණුවයි.

මේ ආකාරයට දිනෙන් දින, යුගයෙන් යුගය නවීන තාක්ෂණය හා මුසුවෙමින් කෘෂි අංශය වර්ධනය වුව ද, සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ කෘෂි අංශය පවතින්නේ කොතැන ද යන්න සොයා බැලිය යුතු ය.

**ශ්‍රී ලංකාවේ කෘෂි අංශය**

ශ්‍රී ලංකාව යුරෝපීයයන්ගේ යටත් විජිතයක් වීමත් සමඟ ම අපේ පැවති සාම්ප්‍රදායික කෘෂි බෝග රටාව උඩු යටිකුරු වන්නට විය. ඒ යැපුම් කෘෂි අංශය, වාණිජ කෘෂි ආර්ථිකයක් බවට පරිවර්තනය වීමත් සමඟ ය. ලංදේසීන් මුලින් ම ආර්ථික බෝගයක් ලෙස මෙරටට හඳුන්වා දෙනු ලැබුවේ කෝපි වගාවයි. අනතුරුව, කොකෝවා වගාව හඳුන්වා දෙනු ලැබුව ද ඒවායින් ලෙසම බලපා තිබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයක් සිදු කිරීමට නම් මෙම යටත්විජිතවාදී ආකල්පයන් ගෙන් අත්මිදිය යුතුම ය. එනම්, තවමත් ශ්‍රී ලංකාව සංවර්ධිත රාජ්‍යයන්ට අමුද්‍රව්‍ය සැපයීමේ රටක් පමණි. ඒවා අපනයනයෙන් ලබන ආදායම දේශීය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා වන ආනයන වියදම පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ. මේ නිසාම, රටක් වශයෙන් අවධානය යොමු විය යුත්තේ අගය එකතු කළ (Value added Products) නිෂ්පාදනයන් ඉහළ නැංවීම කෙරෙහිය. මේ වන තෙක් ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන ආශ්‍රිතව එවැනි පුළුල් වැඩ පිළිවෙළක් යොදා නො තිබීම කණගාටුවට කරුණකි.

ශ්‍රී ලංකාවේ සංවර්ධනය වේගවත් කිරීමට නම් ඒ ඒ පළාත් තුළ පවතින විභවතාවයන් හඳුනාගෙන ඒවා වැඩිදියුණු කිරීම සඳහා වන

**බස්නාහිර පළාත හා අනෙකුත් පළාත් අතර පවතින ආර්ථික අසමානතා**

| බස්නාහිර පළාත | අනෙකුත් පළාත් |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතයෙන් 50%ක දායකත්වය බස්නාහිර පළාතෙන් වන අතර, එහි ප්‍රතිඵල භුක්ති විඳිනු ලබන්නේ ලංකාවේ මුළු ජනගහනයෙන් 28%ක් තරම් වූ ප්‍රමාණයකි. | දළ දේශීය නිෂ්පාදිතයේ ඉතිරි 50% භුක්ති විඳිනු ලබන්නේ 72%ක් තරම් වූ ඉතිරි ජනගහනයයි. |
| ආර්ථිකයෙන් 2/3ක් පමණ සේවාවන් මත පදනම් වේ. | ආර්ථිකයෙන් 1/3ක ප්‍රමාණය පදනම් වන්නේ කෘෂිකර්මාන්තය මතයි. |
| ආර්ථික වර්ධනය 6.3%කි. | ආර්ථික වර්ධනය 3.6%කි. |
| වාර්ෂික ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 2118 | වාර්ෂික ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 838 |
| දුගී බව 8%කි | දුගී බව 18.4%කි |
| විරැකියා අනුපාතය 5.7% | විරැකියා අනුපාතය 6.9% |

**මූලාශ්‍රය** : *World Bank, Sri Lanka Country Assistance Strategy 2009-2012, Washington, 2008*

ඔවුන් බලාපොරොත්තු වූ මට්ටමේ ප්‍රතිඵලයක් ලබා ගත නොහැකි විය. පසු කාලීනව, මෙරට ආක්‍රමණය කළ බ්‍රිතාන්‍යයන් දේශීය කෘෂි කර්මාන්තයට ප්‍රධාන ආර්ථික බෝගය වශයෙන් තේ හඳුන්වා දෙනු ලැබීය. එය කෙතරම් අපේ කෘෂි ආර්ථිකයට මෙන්ම දේශීය ආර්ථිකයට බලපෑම් කළේ ද යත් වර්තමානයේ දී ද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග තුන අතර ප්‍රධාන ස්ථානයක් ගනු ලබන්නේ තේ බෝගය යි. මේ නිසාම ලෝක වෙළෙඳපොළේ උච්චාවචනයන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සෘජු යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුය. කොළඹ නගරය තුළ සියළු පහසුකම් කේන්ද්‍රගතවීම බොහෝ කාලය මෙන්ම මුදල්ද අපතේ යාමට හේතුවක් වී ඇත. ඒ සඳහා දනට රට තුළ පවතින සම්පත් බෙදීයාමේ විෂමතාවය අවම කළ යුතුය. සම්පත් බෙදීයාමේ විෂමතාවය කෙතරම් ද යන්න පහත තොරතුරුවලින් මනාව වටහා ගත හැකිය.

රටක් සංවර්ධනය කිරීමේ දී සංවර්ධනය වූ රාජ්‍යයන් එම සංවර්ධනය ළඟා කර ගත්

## තෝරාගත් රටවල් කිහිපයක දළ දේශීය නිෂ්පාදනය හා ශ්‍රම දයකත්වයන් - 2007

| අංශය | ජපානය | | ජර්මනිය | | බ්‍රිතාන්‍ය | | ශ්‍රී ලංකාව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ද.දේ.නි. සේ. දයකත්වය | ශ්‍රම දයකත්වය | ද.දේ.නි. සේ. දයකත්වය | ශ්‍රම දයකත්වය | ද.දේ.නි. සේ. දයකත්වය | ශ්‍රම දයකත්වය | ද.දේ.නි. සේ. දයකත්වය | ශ්‍රම දයකත්වය |
| කෘෂි අංශය | 1.4 | 4.4 | 0.9 | 2.4 | 0.9 | 1.4 | 12 | 31.3 |
| කාර්මික අංශය | 26.4 | 27.9 | 30.1 | 29.7 | 22.8 | 18.2 | 30 | 26.6 |
| සේවා අංශය | 72.1 | 66.4 | 69.0 | 67.8 | 76.2 | 80.4 | 58 | 42.1 |

***මූලාශ්‍රය : ලෝක බැංකු වාර්තා - 2008***

ආකාරය අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. ඒ අධ්‍යයනයන් තුළින් ශ්‍රී ලංකාවට උකහා ගත හැකි බොහෝ දේ තිබේ. දියුණු කෘෂිකාර්මික රටවල් හා සැසඳීමේ දී, කෘෂි අංශයේ දී ශ්‍රම සම්පත භාවිතා කිරීම ශ්‍රී ලංකාව තුළ මනා කළමනාකාරිත්වයකින් සිදු වී නොමැති බැව් දකිය හැකිය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සංසන්දනාත්මක ව බැලුවහොත් දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි අංශයෙන් 12% වැනි දයකත්වයක් ලැබුනත් එහි යෙදී සිටින ශ්‍රමිකයින් පිරිස 31%ක් තරම් විශාල ප්‍රතිශතයකි. එසේ වුව ද, කෘෂි අංශය දියුණු මට්ටමක පවතින සංවර්ධිත රටවල තත්ත්වය ඊට වෙනස් වේ. දළ දේශීය නිෂ්පාදිතයට එම රටවල දයකත්වය අවම සේ ම ශ්‍රම දයකත්වය ද පවතින්නේ පහළ මට්ටමකිනි. ඊට හේතුව වන්නේ අතිරික්ත ශ්‍රමයක් යම් අංශයක පැවතීමෙන් ඉන් යම් ආදයමක් හෝ ලාභයක් උපයා ගත නොහැකි නිසා ය. එවැනි අවස්ථාවක එම අතිරික්තය ශ්‍රමය වෙනත් අංශයකට යොමු කල යුතුය. එනම් ඵලදායීතාව උපරිම වූ විට, ඊට තවත් ශ්‍රමය යෙදවීමෙන් ඵලදායීතාවයක් බලාපොරොත්තු විය නොහැක. ලෝකයේ දනට බලවතුන් බවට පත් වෙමින් සිටින ඉන්දියාව සහ චීනය වැනි රටවල සංවර්ධන සැලැසුම් අධ්‍යයනය කිරීමේ දී පෙනී යන වැදගත් සාධකයක් වන්නේ ඔවුන් ශ්‍රම සම්පත ඵලදායී ලෙස කළමනාකරණය කර ගෙන තිබීමයි. එසේ වුව ද, ශ්‍රී ලංකාව තුළ තවමත් ශ්‍රම සම්පත මනා ලෙස කළමනාකරණය වී නොමැති බැව් පෙනේ. එම තත්ත්වය කෘෂි අංශයේ ඵලදායීතාව අඩුවීමට ප්‍රධාන හේතුවකි.

ඇමරිකාව, ජපානය, බ්‍රිතාන්‍ය වැනි දියුණු රටවල් මෙවැනි අවස්ථාවන්වල දී අතිරික්ත ශ්‍රමය කාර්මික හා සේවා අංශයන් වෙත මුදා හරිනු ලබයි. ශ්‍රී ලංකාව ද සිදු කළ යුත්තේ එයයි. එනම්, කෘෂි අංශයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ශක්තිමත්, කාර්මික හා සේවා අංශයන් වැඩි දියුණු කිරීම අනිවාර්ය අංශයකි. කෘෂි අංශය මූලික වශයෙන් දියුණු කිරීම තුළ අනෙක් අංශයන් ද වර්ධනය කළ හැකිය. ඊට හේතුව වන්නේ මේ සියල්ල එකිනෙක හා බැඳී පවතින නිසාවෙනි. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන්ම වගා කෙරෙන වී ගතහොත් ඒවා වී වශයෙන් ම නොව සහල්, සහල් පිටි, ඉඳිආප්ප, නූඩ්ල්ස් වැනි ආහාර ද්‍රව්‍යයන් වශයෙන් නිෂ්පාදනය කරන විට කර්මාන්ත අංශය මඟින් ඊට අදළ යන්ත්‍ර - සූත්‍ර, උපකරණ, මෙවලම් වැනි යටිතල පහසුකම් ලබා දිය යුතු ය. එමෙන්ම, මෙවැනි ව්‍යාපාර මහා පරිමාණයෙන් මෙන් ම ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත වන විට සේවා අංශය ද, එනම් රක්‍ෂණය, බැංකු උපදේශන, නීති වැනි සේවා අවශ්‍යතාවය ද ඉහළ යයි. ඒ අනුව, සියළු අංශ සංවර්ධනය කිරීමෙන් තොර ව, රටක් දියුණු කළ නොහැකිය.

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වුවත්, මෙරට තුළ වගා කළ හැකි ආහාර ද්‍රව්‍යයන් 50ට අධික සංඛ්‍යාවක් විදේශයන්ගෙන් ආනයනය කරනු ලබයි. ඒවා අතරින් ඉතාමත් පහසුවෙන් මෙරට වගා කළ හැකි ඉඟුරු, කහ, තක්කාලි වැනි බෝග ද වේ. මේවා සඳහා ඉතා විශාල මුදලක් වාර්ෂිකව විදේශයන් වෙත ගලා යයි. එමෙන් ම සහල්, කුරක්කන්, මුංඇට, කඩල වැනි ධාන්‍ය වර්ග ආනයනය සඳහා ඉතා විශාල මුදලක් වැය කරනු ලැබේ.

මේ සියල්ල ශ්‍රී ලංකාව තුළ වගා කළ හැකි දනටමත් යම් ප්‍රමාණයකින් වගා කෙරෙන ආහාර බෝගයන් ය. ආනයනයට වැය වන්නේ, අපේ රට සංවර්ධනය සඳහා ඇති මුදල් ය.

ආර්ථික සංවර්ධනය තුළ කෘෂි අංශයේ දයකත්වය අංශ කිහිපයක් ඔස්සේ හඳුනාගත හැකිය. ඒවා පහත දක් වේ.

**තෝරා ගත් ආහාර ද්‍රව්‍යයන් කිහිපයක ආනයන ප්‍රමාණයන් සහ වියදම**

| වර්ෂය | සහල් | | කුරක්කන් | | මුං ඇට | | කඩල | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටො.) | වියදම (රු.මි) | ප්‍රමාණය (මෙ.ටො.) | වියදම (රු.මි) | ප්‍රමාණය (මෙ.ටො.) | වියදම (රු.මි) | ප්‍රමාණය (මෙ.ටො.) | වියදම (රු.මි) |
| 1999 | 214,191 | 3,265.5 | 277 | 4.0 | 7,528 | 183.3 | 9,480 | 328.0 |
| 2000 | 14,849 | 287.8 | 522 | 8.9 | 6,767 | 172.5 | 14,317 | 475.5 |
| 2001 | 51,957 | 968.6 | 816 | 12.7 | 8,717 | 271.4 | 13,396 | 530.1 |
| 2002 | 95,100 | 1,732.2 | 1,134 | 17.4 | 7,121 | 223.1 | 17,355 | 624.7 |
| 2003 | 34,401 | 813.4 | 610 | 9.6 | 8,181 | 241.9 | 19,572 | 628.6 |
| 2004 | 221,666 | 6,186.1 | 1,829 | 25.6 | 12,673 | 402.4 | 22,661 | 740.1 |
| 2005 | 51,729 | 1,554.2 | 1,379 | 18.9 | 9,321 | 298.1 | 13,893 | 440.6 |
| 2006 | 11,516 | 576.5 | 1,933 | 22.9 | 11,495 | 390.4 | 18,529 | 658.9 |
| 2007 | 88,003 | 4,261.1 | 2,602 | 38.0 | 12,764 | 821.7 | 14,744 | 1081.7 |
| 2008 | 84,045 | 4,726.8 | 2,881 | 68.1 | 13,728 | 1,187.8 | 17,153 | 1,870.5 |
| 2009 | 63,481 | 3,113.0 | - Na - | - Na - | 13,648 | 1,202.0 | 20,012 | 2,064.0 |

*මූලාශ්‍රය : දත්ත සැකසුම් ඒකකය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය*

Na : Not available

## රටේ පුරවැසියන්ට අවශ්‍ය ආහාර සැපයීම

ජනගහන වර්ධනයත් සමඟ රටක ආහාර අවශ්‍යතාවය දිනෙන් දින ඉහළ යයි. ශක්තිමත් කෘෂි අංශයක වගකීම වන්නේ, අවශ්‍ය ආහාර රට තුළ ම හැකි තරම් නිපදවා ගැනීමයි. ඒ තුළ විදේශයන් වෙත ඇදී යන විශාල ධනස්කන්ධයක් රට තුළ ම රඳවා ගත හැකි වේ. එමෙන්ම, දිනෙන් දින සිදුවන සමාජ-ආර්ථික වෙනස්කම් සමඟ ඕනෑම රටක පුරවැසියන්ගේ පරිභෝජන රටාවන් ද වෙනස් වේ. මෙම වෙනස්වන පරිභෝජන රටාවන්ට අනුව ශ්‍රී ලංකාවේ කෘෂි අංශය ද වෙනස් විය යුතුය. යම් රටක ශ්‍රම බලකාය ලෙඩ රෝගවලින් හෝ මන්දපෝෂණයෙන් පෙළේ නම් එවැනි ශ්‍රම බලකායකට එරට සංවර්ධනය කිරීමේ හැකියාවක් නොමැත. ඒ නිසාම ශක්තිමත් ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවැසි ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම කෘෂි අංශයේ වගකීමයි.

## කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම

කෘෂි කර්මාන්තය මත පදනම් වූ කර්මාන්ත අංශ සඳහා අමුද්‍රව්‍ය සැපයීම කෘෂි අංශයේ ප්‍රධාන කාර්යයකි. අගය එකතු කළ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනයන් දිරි ගැන්වීම මෙහි මූලික ම අරමුණ යි.

## කාර්මික හා සේවා අංශය සඳහා වෙළෙඳ පොළක් ඇති කිරීම

කෘෂි අංශය දියුණු කිරීම යනු තවත් අතකින් කර්මාන්ත හෝ සේවා අංශයට දිරිදීමක් ද වේ. මන්ද එදට වඩා අද කෘෂි අංශය සඳහා තාක්ෂණය යොදා ගැනීම ඉහළ මට්ටමක පැවතීමයි. සේවා අංශය ද මේ සමඟම වර්දනය වේ. එනම්, රක්ෂණ ක්‍රම, බැංකු සේවා, උපදේශන සේවා, නීති සේවා ව්‍යාප්ත වීම තුළ ඒ හා බැඳුණු රැකී රක්ෂා බිහිවීම ද සිදු වේ. කෘෂි අංශයේ සංවර්ධනය තුළින් මේ සියළු අංශ  දියුණුව කරා ගෙන යාමේ හැකියාව පවතී. එමෙන් ම සිදු විය යුත්තේ ද එයයි. කෘෂි අංශය දියුණුවීම තුළ, කාර්මික අංශය නිපදවන නිෂ්පාදන සඳහා වෙළෙඳපොළක් ද වර්ධනය වේ. නිදසුන් ලෙස ශීතකරණ, රූපවාහිනී, රෙදි සෝදන යන්ත්‍ර සඳහන් කළ හැකිය. මේ අනුව, කෘෂි අංශයේ සංවර්ධනය තුළින් අනෙක් අංශයන් වෙත වෙළෙඳපොළක් නිර්මාණය විය යුතු ය.

### නව රැකියා අවස්ථා බිහි කිරීම

කෘෂි අංශය වර්ධනය කිරීම තුළින් නව රැකියා අවස්ථා රැසක් උත්පාදනය කළ හැකිය. එමෙන් ම, ඒවා නව පරපුරට ගැළපෙන ආකාරයෙන් හඳුන්වාදීම තුළ කෘෂි අංශයේ රැකියා අවස්ථා සඳහා නව ආකර්ෂණීය භාවයක් ද ඇති කළ හැකිය.

### අතිරික්ත ශ්‍රමය අනෙක් අංශයන් වෙත යොමු කිරීම

දනට ශ්‍රී ලංකාව තුළ කෘෂි අංශයේ අතිරික්ත ශ්‍රමයක් දකිය හැක. මෙම අතිරික්ත ශ්‍රමයේ ඵලදායීතාවය ලබා ගැනීමට නම් ශ්‍රමිකයන් වෙනත් අංශයක් කරා යොමු කළ යුතුය. ඒ තුළින් ශ්‍රම බලකායේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමට හැකි වේ.

### ශ්‍රී ලංකාවේ කෘෂි අංශය හා බැඳී පවතින ගැටළු

01. **ඉඩම් හා බැඳී ඇති ගැටළු**

ශ්‍රී ලංකාව කුඩා රටක්වීම නිසා ම ඉඩම් ප්‍රමාණය (Land size) පිළිබඳව ගැටළු රැසක් හඳුනා ගත හැකිය. වැඩිවන ජනගහනය සමඟ මෙම ගැටළුව නව තවත් උග්‍ර අතට හැරෙමින් පවතී. මෙයට කදිම නිදසුනක් ලෙස මහවැලි ජනපදිකයන් මේ වන විට, මුහුණ පා ඇති ගැටළු දක්විය හැකිය. මේ වන විට, එම ජනපදවල ජීවත් වන්නේ එහි මුල් පදිංචිකරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවයි. ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අතර මෙම ඉඩම් බෙදීයාම හේතුවෙන් වර්තමානය වන විට එක් අයෙකුට හිමි බිම් ප්‍රමාණය අක්කර භාගය, කාල පමණ දක්වා අඩු වී තිබේ. මේ නිසා ම මහා පරිමාණයෙන් සිදු කෙරෙන ගොවිතැන් කටයුතු සඳහා එය බාධාවක් ව පවතී. එමෙන්ම, වර්තමානයේ සිදු ව ඇති කාළගුණික හා දේශගුණික විපර්යාස හේතුවෙන් ද අපේක්ෂිත මට්ටමේ ඵලදාවක් ජාතික නිෂ්පාදිතයට එකතු කර ගැනීමට නොහැකි වී තිබේ.

අනෙක් කරුණ නම්, ඉඩම් හිමිකම පිළිබඳ ගැටළුවයි. ශ්‍රී ලංකාවේ ගොවීන්ගෙන් 27%කට පමණ ඉඩම් හිමිකම නොමැත. ඔවුන් සිය වගා කටයුතු සිදු කරන්නේ කුලියට හෝ අඳයටයි.

වගා කළ හැකි ඉඩම් ද වර්තමානය වන විට ක්‍රමයෙන් අඩු වී ගොස් තිබේ. ජනගහන වර්ධනයත් සමඟ ම වගා කළ හැකි බිම්වල පවා නිවාස කර්මාන්තශාලා ඉදි කිරීම හේතුවෙන් වගා කළ හැකි බිම් ප්‍රමාණය දිනෙන් දින සීමාසහිත වී තිබේ.

02. **තාක්ෂණය හා බැඳී ඇති ගැටළු**

කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ එදට වඩා වර්තමානයේ තාක්ෂණික මෙවලම් භාවිතා වුව ද, වෙනත් කෘෂිකාර්මික රටවල් හා සසඳ බැලීමේ දී තවමත් සාම්ප්‍රදායික ක්‍රම මෙරට සුලභව භාවිතා වේ. එමෙන්ම, ගොවි ප්‍රජාව තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීම හේතුවෙන් තාක්ෂණය, වගාවන් සඳහා භාවිතා කිරීම ගැටළුවක්ව පවතී. එමෙන්ම ප්‍රමාණවත් තරම් සම්පත් නොමැතිවීම හේතුවෙන් ද ගැටළු රැසක් මතුවී තිබේ. නිදසුනක් ලෙස අම්පාර වැනි වී වගාව බහුලව සිදු කෙරෙන ප්‍රදේශවල යන්ත්‍ර සූත්‍ර භාවිතයේ දී විශාල ඒකාධිකාරයක් දක්නට ලැබේ. තාක්ෂණික මෙවලම් ඇති මුදලාලිලාගේ දැඩි ඒකාධිකාරයට නතුවීමට ගොවීන්ට සිදුව තිබේ. එමෙන්ම, මෙම අංශය තුළ රක්ෂණ ක්‍රම, බැංකු ණය පහසුකම්, උපදේශන සේවාවන්ගේ ව්‍යාප්තිය අවම මට්ටමක පැවතීම සංවර්ධනය කරා යන ගමනේ දී එතරම් සුබදායක තත්ත්වයක් නොවේ. රටක සංවර්ධනය සඳහා එරට ජනතාවගේ ඉතුරුම් ඉතා වැදගත් සාධකයකි. යම් රටක ඉතුරුම් අවම නම් ආයෝජන අවස්ථා මහ හැරී යයි. ඒ නිසාම ඉතුරුම් පිළිබඳව දැනුවත් කිරීමේ උපදේශන සේවාවන් ද අත්‍යාවශ්‍ය වේ.

03. **ග්‍රාමීය ණයගැතිභාවය**

ග්‍රාමීය ණයගැතිභාවය කෘෂි අංශයේ ආවේණික ලක්ෂණයක් තරමටම ඒ හා බද්ධ වී තිබේ. නිරන්තර ණය බරෙන් මිරිකී සිටින ග්‍රාමීය ගොවියා ඉන් මුද ගන්නා තුරු කෘෂි අංශයේ නියම සංවර්ධන ඉලක්ක ළඟා කර ගත නොහැකි වේ. එමෙන්ම, මෙම ග්‍රාමීය ණයගැතිභාවය හේතුවෙන් ගොවීන් කෘෂි අංශය කෙරෙහි තබා ඇති විශ්වාසය බිඳ වැටීමට ද හේතුව වී තිබේ.

04. **වෙළෙඳපොළ ගැටළු**

ගොවීන් යම් යම් කාල වකවානුවල දී ඵලදාවන්ගෙන් ඉහල අස්වැන්නක් ලබා ගත්ත ද එහි වාසිය ඔවුන්ට අත්විඳීමට නො ලැබේ. මෙවැනි නිදසුන් මෙරට කෘෂි අංශයෙන් කොතෙකුත් වාර්තා වී තිබේ. පසුගිය දිනවල කැකිරාවේ ගොවීන්ගේ කැකිරි විකුණා ගැනීමේ දැඩි අපහසුවක් පිළිබඳ පුවත්පත් වාර්තා පළ විය. එමෙන්ම, දෙහි ඵලදාවට ද පසුගිය කාලයේ එවැනිම ඉරණමක් අත් වී

තිබුණි. වී අස්වැන්නට ද එසේම ය. ක්‍රමවත් ගබඩා පහසුකම් නොවීම නිසා ගොවීන් දැඩි අපහසුතාවයන්ට පත්වීම පසුගිය කාලය පුරා ම දක්නට ලැබුණි. මේවා මගහරවා ගැනීමට නම් කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කළ වට්නාකමක් ලබාදිය යුතු ය. අතිරික්ත නිෂ්පාදන දිරිගැන්වීම ද අත්‍යාවශ්‍ය වේ. නිදසුනක් ලෙස දෙහිවලින් කෝඩියල් වර්ග, බීම, ලුණු දෙහි දැමීම වැනි ද නිෂ්පාදනය කිරීම දක්විය හැකිය. ඒ සඳහා අවශ්‍ය පහසුකම්, දැනුම ගොවි ප්‍රජාව වෙත ලබාදීමත්, ඒවා සඳහා ආයෝජන අවස්ථා ඇති කිරීමත් මෙවැනි අවස්ථාවල දී වැදගත් වේ.

එමෙන් ම, වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට අනුව බෝග වගා කිරීමේ ක්‍රමෝපායයන් පිළිබඳව ද ගොවි ප්‍රජාව දැනුවත් කළ යුතු ය. එහි දී, සාම්ප්‍රදායික ක්‍රමයන්ගෙන් බැහැර වූ වගා ක්‍රමයන් හඳුන්වා දිය යුතු ය. නිදසුන් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩඉරිඟු ගොවීන් මුල් කාලයේ දී තමන්ගේ වගාවන් ඉතා විශාල බිම් ප්‍රදේශවල සිදු කළත් වර්තමානය වන විට ඔවුහු තමන්ගේ භූමියේ කොටසින් කොටස වගා කිරීමට පෙළඹී සිටිති. එනම්, මුලින් ම එක් අක්කර භාගයක බිම් සකසා, පැළ සිටුවා ඒවා ක්‍රමයෙන් වැවෙන විට තවත් අක්කර භාගයක නැවතත් බීජ රෝපණය කෙරේ. මේ ආකාරයට තමන් සතු භූමිය කොටස් වශයෙන් බෙද වගා කිරීමට ඔවුන් යොමු වී සිටී. එහි දී එක් බිම් කොටසක තරමක් වැඩුණු වගාවක් ද තවත් කොටසක ඵල දරා ඇති වගාවක් ද දැකිය හැකිය. මෙහි දී එක් කොටසක අස්වැන්න නෙළා වෙළෙඳපොළට නිකුත් කර ටික දිනකින් නැවතත් අස්වැන්න නෙළා ගත හැකි ය. මේ අනුව, එම ගොවීන් වසර පුරාම අස්වැන්න නෙළන අතර වසර පුරාම ආදායම ද ලබා ගනී. වෙළෙඳපොළේ අතිරික්ත නිෂ්පාදනයක් ද ගොඩ නො ගැසේ. මෙහි ඇති වාසිය නම් මුළු වසර පුරාම ඵලදාව නෙළා ගත හැකිවීමයි. එහි දී, වෙළෙඳපොළ ගැටළු මෙන්ම කෘෂි හානිය ද අවම කර ගත හැකි ය.

### 05. යටිතල පහසුකම්වල පවතින දුර්වලතා

ගොවීන්ගේ නිෂ්පාදනයන්ට නිසි මිලක් ලැබීමට නම්, ගොවිපොළේ සිට වෙළෙඳපොළ දක්වා ඒවා පැමිණීමේ දී යහපත් ප්‍රවාහන පහසුකම්, ගබඩා පහසුකම්, සන්නිවේදන ක්‍රම පැවතිය යුතුය. එසේ නොවන්නේ නම් නිෂ්පාදනයන්ට නියම වටිනාකමක් නොලැබී යයි. ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ වෙළෙඳපොළ හසුරුවන ප්‍රධානම බලවේගය වන්නේ තොරතුරු ය. නිවැරදි තොරතුරු ගොවීන්ට ලබා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම්වලින් තොරව වර්තමාන වෙළෙඳපොළ තුළ පවතින තරඟකාරිත්වයට මුහුණදීමට ගොවීන්ට නො හැකිය.

මේ ආකාරයට කෘෂි අංශය දියුණු කිරීම සඳහා අවශ්‍ය මූලික සාධක හඳුනාගෙන ඒවා වැඩි දියුණු කිරීම තුළින් සංවර්ධන ඉලක්ක වඩා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගත හැකිය. ඒ සඳහා රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධවීම තුළ වැඩි ඵලදායීතාවයක් අත් කර ගත හැකිය. ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටක් සංවර්ධනය කිරීමේ දී කෘෂි අංශයේ සංවර්ධනය අමතක කිරීම කිසිසේත්ම කළ නො හැකිය. ඒ අනුව සංවර්ධන ගමන් මගේ දී කෘෂි අංශයේ කාර්යභාරය මැනවින් හඳුනාගෙන එය රටේ සංවර්ධනය උදෙසා ඵලදායී ලෙස දයක කර ගැනීම තුළ වඩා ශක්තිමත් ජාතියක් ලෙස ලෝකය තුළ නැගී සිටීමට හැකි වනු නොඅනුමාන ය.

ඉහත සඳහන් ආකාරයට කෘෂි අංශයේ පවතින ගැටළු හඳුනාගෙන ඒවාට නිසි පිළියම් ලබාදීමෙන් කෘෂි අංශය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දයකත්වය අත්‍යාවශ්‍ය වේ. මේ ආකාරයෙන් කෘෂි අංශය සංවර්ධනය කිරීමෙන් ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීම එතරම් අපහසු කටයුත්තක් නොවේ. අවම සම්පත් සහිතව සිංගප්පූරුව වැනි රටක් එද ශ්‍රී ලංකාව ආදර්ශයට ගෙන වර්තමානය වන විට ඉතා ඉහළ සංවර්ධනයක් අත්පත් කර ගත්තේ නම්, බොහෝ සම්පත් සහිත ශ්‍රී ලංකාව සංවර්ධනය කරා මෙහෙයවීම එතරම් අපහසු කටයුත්තක් නොවේ. අවශ්‍ය වන්නේ නිවැරදි දර්ශනයක් හා ඒ කරා ළඟාවීමට අවශ්‍ය කැපවීම පමණි.


**ඉන්දිකා පතිරණ**
පර්යේෂණ නිලධාරිණී
කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය